

# රසබීම

ශීත කළ බීම නොව,
වැල් දොඩම් – පැණි දොඩම් නොව
ඊට වඩා වැඩි මිලට
බෝතලේ 'හතලිහට' ගෙන
සුදුපාට – අවර්ණෙට,
තියෙන ඒ ගුණ බීම,
සිදාදියෙ මහත්තුරු
නිතර බොන
උජාරුව..........

දොළ දුකක් සිතුණී මට,
බොන්නටත් ඒ
රස බීම.....

තිබුණු පනහෙන්
හතලිහක් දී,
ගතිමි බොන්නට
කෙළ උණන
කැදරට.

සත්තමයි
කියන්නට
අපරාදෙ
'හතලිහම'........

අපේ ගමේ
දොලේ ගලන
වතුරමයි
ඒ .....................

මුදිත ප්‍රසන්නජිත් පෙරේරා
කථිකාචාර්ය
ශ්‍රී ලංකා වන විද්‍යායතනය – වන සංරක්ෂණ
දෙපාර්තමේන්තුව

පින්තූරය : සුරංග රමේෂ්